# බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිල්පයට අයත් කළුතර ඔරලෝසු ස්මාරකය පිළිබඳ සිදු කරනු ලබන අධ්‍යයනයක්

**පුෂ්පමාලි අයි.ඒ.යූ.**[1]

බස්නාහිර පළාතේ කළුතර නගර මධ්‍යයේ පිහිටි ප්‍රධාන ඔරලෝසු ස්මාරකය කාර්මික පුරාවිද්‍යා උරුමයක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම හෝරා ස්තම්භය 1938 දෙසැම්බර් මස 14 වන දින වී. මාර්කස් සිල්වා විසින් තම දෙමාපියන් වූ මතුගම විසූ වී. පෝල් සිල්වා හා අයි. මේරියා ප්‍රනාන්දු දෙදෙනා සිහිවීම උදෙසා ස්මාරකයක් වශයෙන් ඉදිකර ඇත. සමාජය තුළ වැඩි කතාබහට ලක් නොවන කාර්මික පුරාවිද්‍යා උරුමයන් පිළිබඳ අධ්‍යයනයට මෙන්ම ඒවා පිළිබඳ කරුණු ජනගත කිරීමේ අරමුණින් යුතුව සිදුකරන ලද මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන හා සම්මුඛ සාකච්ඡා පැවැත්විණි. බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව නිර්මිත මෙම ස්මාරකයේ ඔරලෝසු, කේබල් ආධාර කරගත් එනජිමක් ඔස්සේ ක්‍රියාත්මකව ඇත. මෙම ස්මාරකය සම්පූර්ණ ගඩොලින් නිර්මාණය කර ඇති අතර මෙහි අභ්‍යන්තරය මුළුමනින්ම චතුරස්‍රාකාර ස්වරූපයක් ගන්නා අතර එහි වහළය යටත් විජිත සමයේ වාස්තු විද්‍යාත්මක ශෛලිය සිහි ගන්වයි. මෙහි අභ්‍යන්තරයේ ඉහළට නැගීම සඳහා වක්‍රාකාර පඩි පෙළක් යොදා ඇත. ආරම්භයේ දී මෙම ඔරලෝසු කණුව තුළ සණ්ඨාර තුනක් පැවති ඇති අතර එය විනාඩි පහළොවෙන් පහළොවට මැතක් වන තුරුත් නාද කරවා ඇතත් වර්තමානය වන විට එම සණ්ඨාර තුන නගර සභාවේ ගබඩාවෙහි තැන්පත් කර ඇත. මීට හේතුව ලෙස පෙරදී සිටි දිසාපතිවරයෙකුට තම නින්ද සඳහා බාධාවක් ගෙන දුන් හෙයින් මෙම සණ්ඨාර තුන අක්‍රිය කරන්නට ඇතැයි ජනප්‍රවාදයකි. මෙහි වත්මන් තත්ත්වය ගැන සැලකිල්ලට ගත්විට සක්‍රීය මට්ටමේ පවත්නා වූ මෙම ඔරලෝසු වර්තමානයේ දී යාන්ත්‍රික ඒකකයක් මඟින් ක්‍රියාත්මක වන අතර එහි පාලනය ස්වයංක්‍රීයව තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ සිදුවේ. ඔරලෝසු කණුවෙහි බාහිර ස්වරූපය ගැන සැලකීමේ දී එහි මුදුනත සිවුකොන කෙළවරේ සිංහ රූප හතරක් පසුකාලීනව නිර්මාණය කර ඇති බව පැහැදිලිය. එතුළින් ගාම්භීරත්වය, තේජස පිළිඹිබු කිරීමට උත්සාහ දරා ඇත. කාර්මික උරුමයක් වන මෙම ඔරලෝසු කණුව පිළිබඳ අධ්‍යයනයේ දී මෙය මනා නඩත්තුවකින් යුතුව පවතින බව පසක් වන අතර ආරම්භක අවධියේ සිට මේ දක්වා වරින් වර බාහිරින් මෙන්ම අභ්‍යන්තරික යාන්ත්‍රික ක්‍රියාවලියේ විවිධ වෙනස්කම් වලට යටත්ව ඇති බව පැහැදිලි ය.

**මුඛ්‍ය පද :** ඔරලෝසු කණුව, බ්‍රිතාන්‍ය, ගෘහනිර්මාණ, කළුතර

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
ushani.pushpamali@gmail.com